**ශීර්ෂය 182 - විදේශ රැකියා අමාත්‍යාංශය පිළිබඳ විගණකාධිපති වාර්තාව 2017 වර්ෂය**

2017 අංක 32 දරණ විසර්ජන (සංශෝධන) පනතින් සංශෝධිත 2016 අංක 24 දරණ විසර්ජන පනතේ පළමුවන උපලේඛනයේ හා තෙවන උපලේඛනයේ සඳහන් ශීර්ෂය හා විෂය අංකය යටතේ වන විසර්ජන ගිණුම, සැසඳුම් ප්‍රකාශනය, විදේශ රැකියා අමාත්‍යාංශය විසින් විගණනයට ඉදිරිපත් කරන ලදි. එම ගිණුම්වලින් හා සැසඳුම් ප්‍රකාශනවලින් නිරූපණය වන මූල්‍ය හා භෞතික කාර්යසාධනය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව ප්‍රකාරව විගණනය කරන ලදී.

## 1.2 ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ, මූල්‍ය කළමනාකරණය හා ගිණුම් කටයුතුභාවය පිළිබඳ වගකීම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 124 ප්‍රකාරව රාජ්‍ය මුදල් ඉපැයීම සහ රජයට ලැබිය යුතු මුදල් එකතු කිරීම මෙන්ම රජයේ සියළුම මුදල් කටයුතු අධීක්ෂණය පිළිබඳ පොදු අවේක්ෂණයද මුදල් අමාත්‍යවරයා වෙත පැවරී ඇත. මුදල් අමාත්‍යවරයා විසින් එම වගකීම ඉටු කිරීම පිණිස මුදල් රෙගුලාසි 124(2) ප්‍රකාරව ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන් පත් කර ඇත. මුදල් රෙගුලාසි 125(1)(අ) ප්‍රකාරව දෙපාර්තමේන්තු ප්‍රධානියා තම දෙපාර්තමේන්තුවේ සියළු මුදල් ගනුදෙනු පිළිබඳව ගණන්දීමේ නිලධාරියා වන අතර ආදායම් ගණන්දීමේ නිලධාරියා භාණ්ඩාගාරය විසින් පත්කර ඇත. පාර්ලිමේන්තුව විසින් පනවන ලද සීමාවන් ඇතුළත තම කාර්යභාරයන් ඉටු කර ඉදිරිපත් කරනු ලබන ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රජයේ මුදල් රෙගුලාසි හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

## 1.3 විගණන විෂය පථය

ශීර්ෂය 182 - විදේශ රැකියා අමාත්‍යාංශයේ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය හා භෞතික කාර්යසාධනය සම්බන්ධයෙන් සැලසුම් කිරීම, රාජ්‍ය වියදම්, රාජ්‍ය ආදායම්, මානව හා භෞතික සම්පත් කළමනාකරණය, අභ්‍යන්තර පාලන විධිවිධාන යොදා ගැනීම, නීති, රීති හා රෙගුලාසිවලට අනුකූලවීම හා පොත්පත්, ලේඛන, වාර්තා හා සැසඳුම් ප්‍රකාශන යාවත්කාලීන කර පවත්වා ගැනීම, ගිණුම් පිළියෙල කර කාලීනව ඉදිරිපත් කිරීම, කාර්යසාධන දර්ශක පදනම් කරගෙන අදාල පාර්ශවයන් වෙත කාර්යසාධන වාර්තා නිකුත් කිරීම පිළිබඳව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධි විධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2018 ඔක්තෝබර් 15 දින අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත නිකුත් කරන ලදි. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද සැලසුම්, ගිණුම්, සැසඳුම් ප්‍රකාශන හා කාර්යසාධන වාර්තා පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

## 1.4 විගණන නිරීක්ෂණ

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විදේශ රැකියා අමාත්‍යාංශයේ සිදු කරන ලද විගණනයේ දී අනාවරණය වූ විගණන නිරීක්ෂණ ඉහත 1.3 ඡේදයේ සඳහන් කර ඇති කළමනාකරණ විගණන වාර්තාවේ විස්තරාත්මකව දක්වා ඇත. එම නිරීක්ෂණ වලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ මෙම වාර්තාවේ 2.1 ඡේදයේ සිට 2.11 දක්වා ඡේදවල සඳහන් කර ඇත. මූල්‍ය පරිපාලනයේ ප්‍රමාණවත් බව තහවුරු වන පරිදි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 127 හි සඳහන් විධිවිධාන ඉටු කිරීමේ දී අනාවරණය වූ පහත

සඳහන් සටහනේ සාරාංශගත කර දක්වා ඇති විගණන නිරීක්ෂණවලට යටත්ව ප්‍රධාන ගණන්දීමේ නිලධාරි වශයෙන් තම ගිණුම් කටයුතුභාවය සතුටුදායක ලෙස ඉටු කර තිබුණු බව නිරීක්ෂණය විය.

| **මුදල් රෙගුලාසි 127 විධිවිධානය** | | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරී එම විධිවිධානයට අනුගත වී නොතිබීම** | **නිරීක්ෂණය ඇතුළත් වාර්තාවේ ඡේද යොමුව** |
|---|---|---|---|
| මුදල් රෙගුලාසි | | | |
| 127 (1)(අ) | නිවැරදිව සහ මූල්‍ය විධිමත් බවෙන් යුක්තව කටයුතු කරන බව තහවුරුවන පරිදි සියළු මූල්‍ය කාර්යයන් සැලසුම් කළ යුතු වීම. | 1. ක්‍රියාකාරී සැලැස්ම නිවැරදි ලෙස පිළියෙල කර නොතිබුණි. | 2.1.1 |
| | | 2. ප්‍රසම්පාදන කටයුතු ප්‍රමාණවත් පරිදි සැලසුම් නොකිරීම. | 2.2.1 |
| 127(1)(ආ) | වියදම් සහ රාජ්‍ය ආදායම් එකතු කිරීම පිළිබඳව ප්‍රමාණවත් තරම් පාලනයකට විධිවිධාන සැලැසෙන ක්‍රමයක් සම්පාදනය කල යුතු වීම. | 1. අවිධිමත් ගනුදෙනු | 2.4 |
| | | 2. කළමනාකරණ අඩුපාඩු | 2.7 |
| | | 3. විසඳා නොතිබුණු විගණන ඡේද | 2.6 |
| | | 4. මානව සම්පත් කළමනාකරණයේ අඩුපාඩු | 2.16 |
| 127 (2) | තමාගේ පාලනය යටතේ පවත්නා දෙපාර්තමේන්තුවල එවකට තිබෙන වැය විෂයයන් මෙන්ම අළුතින් හෝ වැඩියෙන් වියදම් කිරීම සඳහා වන යෝජනා සැකසුරුවම්කම හා කාර්යක්ෂමතාවය අතින් අමාත්‍යාංශයේ දී තියුණු පරීක්ෂාවකට භාජනය කිරීම. | 1. කාර්යභාරයන් ඉටුනොකිරීම. | 2.1.2 |
| | | 2. විදේශාධාර ව්‍යාපෘතිවල කාර්යසාධනය ඉටු නොවීම. | 2.1.3 |
| | | 3. ප්‍රසම්පාදන ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීමේ අඩුපාඩු | 2.2.2 |
| 127(3) | ස්වකීය පරිපාලනාත්මක කෘතහස්තතාව හා විචාර බුද්ධිය මෙහෙයවා සුදුසු පරිදි ක්‍රියා කළ හැකි වන පිණිස සැකයක් හෝ උද්ගත වී ඇති සියළු ප්‍රශ්ණ තමා වෙත ඉදිරිපත් වෙන ආකාරයක් සලසා තිබීම. | වත්කම් කළමනාකරණයේ අඩුපාඩු | 2.3 |
| 127 (5) | දෙපාර්තමේන්තුවේ ඇස්තමේන්තුවල ප්‍රතිපාදිත මුදල හා වියදම අතර ඇති සැලැකිය යුතු වෙනස්වීම් අමාත්‍යාංශයේ දැඩි ලෙස පරීක්ෂණයට භාජනය කෙරෙන බව | සලසා තිබුණු ප්‍රතිපාදන උපයෝජනය නොකිරීම. | 2.8 |

| | | | | |
|---|---|---|---|---|
| 127 (6) | ගණන්දීමේ නිලධාරීන්ගේ වගකීම පිට පවත්නා වූ ආදායම් නොහොත් රජයට ලැබිය යුතු වෙනත් ගාස්තු එකතු කිරීමේ කාර්යය ගැන දැඩි සෙවිල්ලෙන් සිටිමින් එම කාර්යය අමාත්‍යාංශයේ පරීක්ෂණයට භාජනය කිරීම | | රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුමේ සඳහන් අඩුපාඩු | 2.9 |
| 127 (7) | නිලධාරීන්ගේ/ සේවකයින්ගේ ප්‍රමාදය, නොසැලකිල්ල, වරද හෝ වංචාව නිසා රජයට පාඩු සිදු වී ඇති අවස්ථාවලදී මුදල් රෙගුලාසි 103 සිට 108 දක්වා රෙගුලාසිවල නියම කර ඇති කාර්ය පරිපාටිය ගණන්දිමේ නිලධාරීන් විසින් අනුගමනය කරනු ලබන බවටද, මුදල් රෙගුලාසි 156(1) අනුව එම පාඩු සම්බන්ධයෙන් වගකිව යුතු නිලධාරීන් / සේවකයන් මත අධිභාර පැනවීමද, වගබලා ගැනීම පිණිස විධිවිධාන යොදන ලද්දේනම් තමා වෙත පැවරී ඇති වගකීම්වලින් ගණන්දීමේ නිලධාරියා නිදහස් වූවාක් ලෙස සලකනු ලැබේ. රාජ්‍ය ගිණුම් කාරක සභාව හමුවේ පෙනී සිට, තමා වගකීම් දරන දෙපාර්තමේන්තුවල ගිණුම් පැහැදිලි කිරීමෙන් ගණන්දීමේ නිලධාරියා සමඟ සහාය විමද ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ රාජකාරි භාරයක් වීම. | 1. | පාඩු හා හානි | 2.5 |
| | | 2. | මුදල් සම්බන්ධව කටයුතු කරන නිලධාරීන්ගෙන් ඇප තැන්පත් ලබා නොගැනීම | 2.11 |

## 2. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ

-----------------------------------------------------

### 2.1 කාර්යසාධනය

----------------

#### 2.1.1 සැලසුම් කිරීම

--------------

අමාත්‍යාංශය විසින් එහි අරමුණු හා පරමාර්ථ ඉටු කර ගැනීමට හැකිවන පරිදි දිගු කාලීන සැලසුම් සකස් කර නොතිබුණු අතර වාර්ෂික ක්‍රියාකාරී සැලසුම්වල ඇතුලත් මූලික කාර්යය සාධන දර්ශකයන් (KPI's) කෙටිකාලීන නිමැවුම මැනීම සඳහා සුදුසු වුවත් ආයතනික අරමුණු ඉටු කර ගැනීමේ සඵලදායීතාවය මැනීම සඳහා යෝග්‍ය නොවන බව නිරීක්ෂණය කෙරේ. ඒ අනුව, අමාත්‍යාංශය එහි දිගුකාලීන දැක්ම කරා මෙහෙයවීමේදී පවතින සැලසුම්කරන ක්‍රමවේදය සැලකිය යුතු කාර්යයභාරයක් ඉටුනොකරන බව නිරීක්ෂණය විය.

**2.1.2 කාර්යභාරයන් ඉටු නොකිරීම**

---------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) අමාත්‍යාංශයේ ප්‍රමුඛ ක්ෂේත්‍රයක් (Thrust Area) ලෙස විදේශ වෙළඳපල ප්‍රවර්ධනය දක්වා තිබුණ ද 2016 වර්ෂයේ විදේශ රැකියා සඳහා පිටත්වී ඇති ශ්‍රමිකයින් සංඛ්‍යාව 242,930 ක් වූ අතර 2017 වර්ෂයේ එම සංඛ්‍යාව 212,162 ක් දක්වා එනම් සියයට 12.67 කින් අඩුවී තිබුණි.

(ආ) සංක්‍රමණික සේවා නියුක්තිකයන් සම්බන්ධයෙන් අමාත්‍යාංශය විසින් විවිධ රටවල් සමඟ අත්සන් කරන ලද අවබෝධතා ගිවිසුම් 20 ක් 2017 වර්ෂය වන විට ක්‍රියාත්මක වෙමින් තිබුණි. අවබෝධතා ගිවිසුම් 12 ක් සම්බන්ධයෙන් සිදුකල නියැදි විගණන පරීක්ෂණයේ දී අනාවරණය වූ කරුණු.

**(I) එම ගිවිසුම් කාලීනව යාවත්කාලීන කිරීම සහ පසු විපරම් කිරීම් සිදුකර නොතිබුණි.**

(i) ජෝර්දානය සමඟ අත්සන් කර ඇති ගිවිසුම - නැවත සමාලෝචනය කිරීමට 2016 ජූලි 12 දින විදේශ කටයුතු අමාත්‍යාංශය හරහා ජෝර්දාන්හි ශ්‍රී ලංකා තානාපති කාර්යාලය වෙත දැනුම් දී ඇතත් 2018 අගෝස්තු 28 වන විටත් අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ii) බහරේන් රාජ්‍ය සමඟ වන ගිවිසුම විදේශ කටයුතු අමාත්‍යාංශය හරහා බහරේන්හි ශ්‍රී ලංකා තානාපති කාර්යාලය වෙතින් නැවත සමාලෝචනය සඳහා 2016 ඔක්තෝබර් 25 දින ලිපියක් යොමු කර තිබුණත් 2018 අගෝස්තු 28 දක්වා ඒ සම්බන්ධයෙන් ප්‍රතිචාර ලැබී නොතිබුණි.

**(II) ගිවිසුම්ගත රටවල් සමඟ ඒකාබද්ධ කමිටු රැස්වීම් නිසි පරිදි පවත්වා නොතිබුණි.**

(i) ගිවිසුම්ගත රටවල් 12 න් කටාර්, ඕමාන් සහ සෞදි අරාබිය යන රටවල් සමඟ 2009 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා පිළිවෙලින් ඒකාබද්ධ කමිටු රැස්වීම් 4 ක්, 3 ක් සහ 2 ක් පමණක් පවත්වා තිබුණි. අනෙකුත් ගිවිසුම් වලට අදාලව ඒකාබද්ධ කමිටු රැස්වීම් පැවැත්වූ බවට තොරතුරු විගණනයට ඉදිරිපත් නොවීය.

(ii) ගිවිසුම් ප්‍රකාරව බහරේන් සහ කුවේට් යන රාජ්‍යයන් සමඟ වාර්ෂිකව ඒකාබද්ධ කමිටු රැස්වීම් පැවැත්විය යුතු වුවත් 2009 වර්ෂයේ සිට රැස්වීම් පවත්වා නොතිබුණි.

**2.1.3 විදේශාධාර ව්‍යාපෘති**

---------------------

ශ්‍රී ලංකා රජය සහ ස්විට්සර්ලන්ත රජය එක්ව ශ්‍රී ලංකාවේ විගමණික සේවකයන් සහ ඔවුන්ගේ පවුල්වල සුරක්ෂිතතාව සහ සමෘද්ධිය කෙරෙහි දායකවීමේ අරමුණ ඇතිව "යහපත් රැකියා ශ්‍රම විගමණිකයන්ගේ සහ ශ්‍රී ලංකාවේ සිටින ඔවුන්ගේ පවුල්වල ආරක්ෂාව සහ යහපැවැත්ම" නමින් වැඩසටහනක් ක්‍රියාත්මක කර තිබුණි. එම වැඩසටහන සඳහා ස්විට්සර්ලන්ත රජය ඇ.ඩො. 3,875,000 ක ආධාර මුදලක් ලබා දීමට එකඟවී තිබුණි.
මේ සම්බන්ධයෙන් පහත සඳහන් තොරතුරු නිරීක්ෂණය විය.

(අ) මීට අදාල අමාත්‍යමණ්ඩල තීරණය අනුව, විදේශ සම්පත් දෙපාර්තමේන්තුව හරහා අදාල ආධාර මුදල් ලබා ගැනීමට තීරණය කර තිබුණි. ඊට අදාල නියමයක් අවබෝධතා ගිවිසුමට ඇතුළත් කරන ලෙස විදේශ රැකියා ප්‍රවර්ධන හා සුබසාධන අමාත්‍යාංශයේ ලේකම් විසින්, ස්විට්සර්ලන්ත රජය නියෝජනය කරන ආයතනයට දන්වා තිබුණි. එහෙත් එවැනි නියමයක්

ගිවිසුමට ඇතුළත් කර නොතිබුණි. එසේම අමාත්‍යාංශයේ වැය ශීර්ෂය මඟින් මෙම අරමුදල් ලබා ගෙන නොතිබුණු අතර ව්‍යාපෘතිය විගණනය සම්බන්ධ තොරතුරුද ගිවිසුමට ඇතුළත්වී නොතිබුණි.

(ආ) ගිවිසුම් ප්‍රකාරව ව්‍යාපෘති කාලය 2016 පෙබරවාරි 28 දින අවසන් වීමට නියමිතව තිබුණත් 2015 වර්ෂයේදී එම කාලය වර්ෂ 2020 දක්වා දීර්ඝ කර තිබුණි. එහෙත් නව වැඩසටහනට අදාල විස්තර ඇතුළත් ප්‍රධාන සැලැස්ම විගණනයට ඉදිරිපත් නොකෙරුණි. මුල් වැඩසටහනෙහි ප්‍රධාන සැලැස්ම විගණනයට ඉදිරිපත් කර තිබුණත්, එහි ව්‍යාපෘතියෙහි විෂය පථය, ක්‍රියාකාරකම්, කාල විශ්ලේෂණය, පිරිවැය වර්ගීකරණය, මානව සම්පත, අමුද්‍රව්‍ය සහ අනෙකුත් උපකරණ සැලසුම් කිරීම, වගකීම් පැවරීම, සන්නිවේදන සැලසුම්, වාර්තාකරණය යනාදී මූලිකාංග ඇතුළත්ව නොතිබුණි.

(ඇ) උක්ත වැඩසටහනට අදාලව විගණනයට ඉදිරිපත් කර තිබූ ක්‍රියාකාරී සැලැස්මෙහි අමාත්‍යාංශයේ කාර්යභාරය ඉටු කිරීමේ දී අවධානය යොමු කල යුතු ප්‍රධාන ක්ෂේත්‍රයන් (Thrust areas), නිමැවුම් (Output), ප්‍රතිලාභ (Outcome) හා ඒ අනුව හඳුනාගනු ලබන මූලික කාර්ය සාධන දර්ශකයන් (KPI) ඇතුලත්ව නොතිබුණි.

(ඈ) වැඩසටහනෙහි ප්‍රගතිය පරීක්ෂා කිරීමට අවශ්‍ය තොරතුරු විගණනය සඳහා ඉල්ලුම් කර තිබුණද ඊට අදාල සවිස්තර තොරතුරු විගණනය සඳහා ලැබී නොතිබුණි. ඒ අනුව වැඩසටහනෙහි සමස්ථ ක්‍රියාකාරීත්වය පිළිබඳ නිරීක්ෂණ වාර්තා කළ නොහැකි විය.

## 2.2 ප්‍රසම්පාදන ක්‍රියාවලිය මඟින් සැපයීම් හා සේවා ලබා ගැනීම

---

### 2.2.1 ප්‍රසම්පාදන සැලසුම් කිරීම

---

අමාත්‍යාංශය වෙත සමාලෝචිත වර්ෂයේ දී ප්‍රසම්පාදන ක්‍රියාවලිය මඟින් සැපයීම් හා සේවා ඉටු කර ගැනීම සඳහා රු.මිලියන 128.26 ක ප්‍රතිපාදන සලසා තිබුණු අතර, ඉන් රු.මිලියන 123.85 ක් උපයෝජනය කර තිබුණි. එහෙත් මෙම සම්පූර්ණ ප්‍රතිපාදනය සඳහා වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කරනු වෙනුවට රු.මිලියන 76.4 ක ප්‍රතිපාදන සඳහා පමණක් සැලසුම් සකස් කර තිබුණි.

### 2.2.2 ප්‍රසම්පාදන ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීම

---

විගමණික ශ්‍රමිකයන් සම්බන්ධව පවුල් පැතිකඩ නිර්මාණය හා ඔවුන් සම්බන්ධ තොරතුරු පරිගණක ගත කිරීමේ අරමුණෙන් ප්‍රදේශීය ලේකම් කාර්යාල 329 ක් සඳහා පරිගණක කට්ටලය බැගින් ලබාදීමට සැලසුම් කර තිබුණි. එහි පළමු පියවර ලෙස 2016 හා 2017 වර්ෂවල පිළිවෙලින් පරිගණක 242 ක් හා 35 ක් ලෙස පරිගණක 277 ක් රු. 35,500,959 ක් වැය කර මිලදී ගෙන බෙදාහැර තිබුණි. එහෙත් විගණන දිනය වූ 2018 අගෝස්තු 15 දින වන විටත් ඉතිරි ප්‍රාදේශීය ලේකම් කාර්යාල 52 ක වෙනුවෙන් පරිගණක සහ අනෙකුත් උපාංග මිලදී ගැනීමට නොහැකි වී තිබුණි. ඒ අනුව අපේක්ෂිත වැඩසටහන ක්‍රියාත්මක කිරීමට නොහැකිවී තිබුණු අතර මිලදීගත් පරිගණකවල ඵලදායී ජීවිත කාලය ඉක්මවා යාම සහ පරිගණක තාක්ෂණික වශයෙන් යල්පැනයාමේ අවදානමක් පැවතුනි.

## 2.3 වත්කම් කළමනාකරණය

---

අමාත්‍යාංශයේ වත්කම් සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරීක්ෂාවේ දී පහත සඳහන් අඩුපාඩු අනාවරණය විය.

(අ) **මූලා හා මෙහෙයුම් කල් බදු ක්‍රමය යටතේ වාහන උපයෝජනය**

අමාත්‍යාංශය විසින් මූලා කල්බදු ක්‍රමය යටතේ වාහන 05 ක් ලබාගෙන, ඒ සඳහා කල්බදු වාරික, ඉන්ධන හා ලිහිසි තෙල් සඳහා (රියදුරු වැටුප් දීමනා හැර) රු.8,064,350 ක් වැය කර තිබුණි. එම වාහන වලින් 2017 වර්ෂය තුල කිලෝ මීටර් 54,757 ක් ධාවනය කර තිබුණි. ඒ අනුව එක් කිලෝ මීටරයක් ධාවනය සඳහා රු.147.29 ක් වැය වී තිබුණි.

(ආ) **පිරිවැය හා කාර්යක්ෂමතාවයකින් තොරව වත්කම් අපහරණය කිරීම**

2012 වර්ෂයේ දී රජයේ තක්සේරු විසින් රු.මිලියන 2.8 කට තක්සේරු කර තිබු අමාත්‍යාංශයට අයත් වාහනයක් අපහරණය කිරීමට එම වර්ෂයේදීම රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව විසින් අනුමත කර තිබුණු නමුත් 2014 වර්ෂය දක්වා එම වාහනය අපහරණය කර නොතිබුණි. එසේ වුවද 2014 ඔක්තෝබර් 01 දින අභ්‍යන්තර කමිටුවක් විසින් එය රු.400,000 කට තක්සේරු කර ටෙන්ඩර් කැඳවා 2015 වර්ෂයේ දී එය රු.1,274,900 කට විකුණා තිබුණත් වාහනයේ ලියාපදිංචි සහතික ඉදිරිපත් කිරීමට නිලධාරීන් අපොහොසත් වීම නිසා ගැණුම්කරු වෙත ආපසු මුදල් ගෙවීමට සිදු වී තිබුණි. රජයේ අපහරණ ක්‍රියාවලිය අවිධිමත්ව සිදුකර තිබුණ අතර ඒ සඳහා වන පුවත්පත් දැන්වීම් වෙනුවෙන් අවස්ථා දෙකකදී රු.170,526 ක් වැයකර තිබුණි.

## 2.4 අවිධිමත් ගනුදෙනු

අමාත්‍යාංශය විසින් මෙහෙයුම් කල්බදු ක්‍රමය යටතේ ඩබල් කැබ් රථ 05 ක් ප්‍රසම්පාදනය කර 2017 වර්ෂයේ මාස 10 ක කුලිය ලෙස රු.7,956,850 ක් ගෙවා තිබීම සම්බන්ධයෙන් පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(i) 2016 මාර්තු 17 දිනැති අංක 01/2016 දරන ජාතික අයවැය චක්‍රලේඛයේ 2.1 ඡේදය ප්‍රකාරව වාහන අවශ්‍යතාවය සමාලෝචනය කරන ලද කමිටුවේ සභාපතිත්වය අමාත්‍යාංශ ලේකම් විසින් දරා නොතිබුණි.

තවද, එම කමිටු වාර්තාව ලැබීමට පෙර එනම් 2016 අප්‍රේල් 19 දින භාණ්ඩාගාර අනුමැතිය ලැබී තිබුණි.

(ii) උක්ත චක්‍රලේඛයේ 2.3 ඡේදය ප්‍රකාරව රජයේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුව තරඟකාරී මිල ගණන් කැඳවීම හරහා ප්‍රසම්පාදනය කළ යුතු වුවද, ප්‍රසම්පාදන ක්‍රියාවලියෙහි පහත සඳහන් අඩුපාඩු සිදුවී තිබුණි.

- ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අත්පොතෙහි 3.4 (ඇ) iii ඡේදයට පටහැනිව මිල ගණන් කැඳවීමේ දී පළමු සහ දෙවන අවස්ථාවලදී ප්‍රතිචාර නොදක්වන ලද සැපයුම්කරුවන් 09 දෙනෙකුගෙන් තෙවන අවස්ථාවේදීත් මිළ ගණන් කැඳවා තිබු අතර ඔවුන් ඊට ද ප්‍රතිචාර දක්වා නොතිබුණි.

  තවද, පළමු සහ දෙවන වර මිළ ගණන් ඉදිරිපත් කරන ලද සැපයුම්කරුවන් තෙවන වර මිළ ගණන් කැඳවීමේ දී නොසලකා හැර තිබුණි.

- ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ ඡේද අංක 6.3.2 ප්‍රකාරව ප්‍රමාද වී ලැබෙන ලංසු ප්‍රතික්ෂේප කළයුතු වුවද ලංසු විවෘත කළ යුතුව තිබු දිනට දින හතරකට පසුව

එවා තිබූ ලංසුවක් මිල ගනන් ඇගයීමේ දී සැලකිල්ලට ගෙන එම ලංසුව ඉදිරිපත් කල ආයතනය සැපයුම්කරු ලෙස තෝරා ගෙන තිබුණි.

(iii) 2016 සැප්තැම්බර් 19 දිනැති ජාතික අයවැය චක්‍රලේඛ අංක 01/2016 (i) අනුව අමාත්‍ය කාර්ය මණ්ඩලයට වාහන මිලදී ගැනීම සඳහා වැට් රහිත උපරිම මාසික බදු කුලිය රු.135,000 ක් විය යුතු වුවත් ඉහත වාහන වෙනුවෙන් රු.165,000 ක මාසික බදු කුලී ගෙවා තිබුණි.

## 2.5 පාඩු හා හානි

---------------

සමාලෝචිත වර්ෂය තුලදී වාහන 2 ක් අනතුරට පත්ව තිබූ අතර එම වාහනවල රක්ෂණයෙන් ආවරණය නොවූ එකතුව රු.289,626 ක මූල්‍ය අලාභයක් සිදු වී තිබුණි. මුදල් රෙගුලාසි ප්‍රකාරව එම පාඩුව ආවරණය කර ගැනීමට සහ ඊට අදාල තොරතුරු හානි පාඩු ලේඛනයක හා විසර්ජන ගිණුමෙහි සටහන් කිරීමට කටයුතු කර නොතිබුණි.

## 2.6 විසඳා නොතිබුණු විගණන ඡේද

------------------------------------

2016 නොවැම්බර් 09 දිනැති අ.ම.ප16/2048/741/011 අංක දරන අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි රජයේ කඩිනම් සහන වැඩසටහන යටතේ හඳුන්වාදුන් විගමණික සේවකයන් සඳහා වූ විශ්‍රාම වැටුප් ක්‍රමය 2018 ජූලි 31 දින වන විටත් ක්‍රියාත්මක වී නොතිබුණි.

## 2.7 කළමනාකරණ දුර්වලතා

----------------------------

නියැදි විගණන පරීක්ෂණවලදී පහත සඳහන් දුර්වලතා නිරීක්ෂණය විය.

(අ) ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට අනුයුක්තව සිටින සංවර්ධන නිලධාරීන් විසින්, විගමණිකයන් වෙනුවෙන් පවුල් පසුබිම් වාර්තා නිර්දේශ කිරීමේ දී සිදුකරන ලද විෂමාචාරයන් සම්බන්ධයෙන් එල්ලවන චෝදනාවලට අදාල විනය පරීක්ෂණ මන්දගාමීව සිදුවන බව නිරීක්ෂණය විය. නියදි පරීක්ෂණයට භාජනය වූ නිලධාරීන් 17 දෙනෙකු සම්බන්ධයෙන් එසේ එල්ලවී ඇති චෝදනා සම්බන්ධයෙන් විනය ක්‍රියාමාර්ග ගැනීම වර්ෂ 01 සිට 03 දක්වා කාලයක් ප්‍රමාද වී තිබුණි.

(ආ) 2017 වර්ෂයේ සිදු වී තිබූ වාහන අනතුරු 09 ක් පිළිබඳව 2015 ඔක්තෝබර් 09 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක PFD/PED/2015/08/පොදු(i) සහ 104(1), (3), (4) හා 110 මුදල් රෙගුලාසි ප්‍රකාරව අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කර නොතිබුණි.

## 2.8 කාර්යභාරයන් ඉටු කිරීම සඳහා පාර්ලිමේන්තුව විසින් සලසා තිබුණු ප්‍රතිපාදනය උපයෝජනය කිරීම

-----------------------------------------------------------------------------------------------

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂ 05 ක කාලය තුළ අමාත්‍යාංශයට සලසා තිබුණු ප්‍රතිපාදනය, උපයෝජනය හා ඉතිරිය පිළිබඳ තොරතුරු හා ඒ පිළිබඳ විගණන නිරීක්ෂණ පහත දැක්වේ.

| වර්ෂය | වියදම් වර්ගය | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|---|
| ----- | ------------ | ----------- | ----------- | --------- | ------------------ |
| | | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| 2013 | පුනරාවර්තන | 199 | 197 | 2 | 1 |
| | මූලධන | 225 | 205 | 20 | 8.88 |
| | **එකතුව** | **424** | **402** | **22** | **5.18** |
| 2014 | පුනරාවර්තන | 469 | 455 | 14 | 2.98 |
| | මූලධන | 204 | 187 | 17 | 8.33 |
| | **එකතුව** | **673** | **642** | **31** | **4.6** |
| 2015 | පුනරාවර්තන | 612 | 538 | 74 | 12.09 |
| | මූලධන | 533 | 425 | 108 | 20.26 |
| | **එකතුව** | **1145** | **963** | **182** | **15.88** |
| 2016 | පුනරාවර්තන | 619 | 593 | 26 | 4.2 |
| | මූලධන | 524 | 476 | 48 | 9.16 |
| | **එකතුව** | **1143** | **1069** | **74** | **6.47** |
| 2017 | පුනරාවර්තන | 624 | 606 | 18 | 2.88 |
| | මූලධන | 129 | 120 | 9 | 6.97 |
| | **එකතුව** | **253** | **727** | **27** | **10.67** |

සමාලෝචිත වර්ෂය සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**අයවැය ඇස්තමේන්තු පිළියෙල කිරීම**

**----------------------------------------**

අමාත්‍යාංශයට අදාළ කාර්යභාරයන් ඉටුකර ගැනීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන සලසා ගැනීම සඳහා පිළියෙල කර තිබුණු අයවැය ඇස්තමේන්තුව තාත්වික ලෙස පිළියෙල කර නොතිබුණි. විස්තර පහත දැක්වේ.

(i) අමාත්‍යාංශ ගොඩනැගිල්ල වෙනත් ස්ථානයකට ගෙන යාම අරමුණු කරගෙන මූලධන වැය විෂයන් 02 ක් යටතේ එකතුව රු.2,200,000 ක් ද, පුනරාවර්තන වැය විෂයන් 03 යටතේ එකතුව රු.6,250,000 ක් ද වශයෙන් එකතුව රු.8,450,000 ක ප්‍රතිපාදන වෙන් කර තිබුණි. එසේ වුවද, කාර්යාල ගොඩනැගිල්ල ඉදිකිරීම පිළිබඳව කාල වකවානු නිශ්චිත නොවුණු බැවින් ප්‍රාග්ධන වැය විෂයන් යටතේ වූ සම්පූර්ණ ප්‍රතිපාදනය සහ පුනරාවර්තන වැය විෂයන් යටතේ වූ ප්‍රතිපාදන වලින් රු.5,309,002 ක් එනම් මුළු ප්‍රතිපාදයෙන් සියයට 85 ක් ඉතිරි වී තිබුණි.

(ii) මූලධන වත්කම් පුනරුත්තාපනය යටතේ, යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ සඳහා රු.2,200,000 ක ප්‍රතිපාදන සලසාගෙන තිබුණත් ඒ සඳහා වෙන්කළ සම්පූර්ණ ප්‍රතිපාදනයම ඉතිරි වී තිබුණි.

(iii) වැය විෂයයන් 02 ක් සඳහා රු.11,660,000 ක ප්‍රතිපාදන සලසා තිබූ නමුත් 2017 අප්‍රේල් 27 දිනැති අංක 255/2017 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ 02 (අ) ඡේදයට පටහැනිව රු.11,775,200 ක් වියදම් දැරීම හේතුවෙන් ප්‍රතිපාදිත මුදල ඉක්මවා රු.115,200 ක් වියදම් දරා තිබුණි.

**2.9 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම**

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

අමාත්‍යාංශයට අදාල විෂය අංක 18201 යටතේ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක් වේ.

| වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|
| උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| 35.00 | 31.14 | 10.00 | 14.11 | 80.00 | 48.86 |

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණය කරනු ලැබේ.

**හිඟ හිටි ණය ශේෂ අය කර නොගැනීම**

විගණනයට ඉදිරිපත් කල සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව 2017 දෙසැම්බර් 31 දිනට අයවිම් හිඟ හිට තිබුණු රු. 353,626 ක් වූ ණයශේෂ වර්ෂ 01 සිට වර්ෂ 04 ක් දක්වා කාල පරාසයක සිට පැවත එමින් තිබුණත් එම ශේෂ අය කර ගැනීමට අමාත්‍යාංශය අපොහොසත් වී තිබුණි.

**2.10 මානව සම්පත් කළමනාකරණය**

**අනුයුක්ත කාර්ය මණ්ඩලය, තථ්‍ය කාර්ය මණ්ඩලය හා පුද්ගල පඩිනඩි සඳහා වියදම**

අමාත්‍යාංශයේ කාර්යභාරය ඉටු කිරීම සඳහා 2017 දෙසැම්බර් 31 දිනට අනුමත, තථ්‍ය හා පුරප්පාඩු හා අතිරික්ත කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර පහත දැක් වේ. සමාලෝචිත වර්ෂය වෙනුවෙන් අමාත්‍යාංශය විසින් පුද්ගල පඩිනඩි වැය කාණ්ඩය වෙනුවෙන් රු.මිලියන 493 ක් වැය කර තිබුණි. ඒ අනුව ඒක පුද්ගල වියදම රු.472,178 ක් වී තිබුණි.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 12 | 09 | 03 |
| (ii) | තෘතියික මට්ටම | 02 | 02 | - |
| (iii) | ද්විතියික මට්ටම | 1218 | 1008 | 210 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 27 | 25 | 02 |
| | **එකතුව** | **1259** | **1044** | **215** |

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) ප්‍රාදේශීය මට්ටමින් විගමණික තොරතුරු රැස්කිරීම, අධීක්ෂණය සහ පසු විපරම් කටයුතු සඳහා සංවර්ධන නිලධාරීන් බඳවාගෙන තිබුණු අතර සමාලෝචිත වර්ෂය නිම වන විට එම කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු 215 ක් පැවතුනත් දිස්ත්‍රික්ක 06 ක ප්‍රාදේශීය ලේකම් කාර්යලවල නිලධාරීන් 09 ක අතිරික්තයක් පැවතුණි. ඒ අතුරින් ඌව, උතුරු මැද, උතුරු හා නැගෙනහිර පළාත්වල වැඩි වශයෙන් පුරප්පාඩු පැවති බව නිරීක්ෂණය විය.

(ii) අමාත්‍යාංශයේ සමාලෝචිත වර්ෂයේදී කාර්ය මණ්ඩලය 1044 දෙනෙකු සේවා නියුක්තව සිට ඇති අතර එම නිලධාරීන් පුහුණු කිරීම සඳහා රු.5,000,000 ක වාර්ෂික ප්‍රතිපාදන සලසාගෙන තිබුණි. එහෙත් අමාත්‍යාංශය විසින් සියළුම නිලධාරීන් ආවරණය වන පරිදි පුහුණු සැලැස්මක් සකස් කර පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කර නොතිබුණු අතර කාර්යය මණ්ඩලයෙන් 52 ක් සඳහා වර්ෂය තුල කිසිදු පුහුණුවක් ලබා දී නොතිබුණි. එමෙන්ම ඉහත ප්‍රතිපාදන මුදලින් රු.497,426 ක් පුහුණු කිරීම් සඳහා උපයෝගී කරගෙන නොතිබුණි.

## 2.11 රජයේ නිලධාරීන් ඇප තැබීම

මුදල් රෙගුලාසි 880 ප්‍රකාරව ඇප තැබිය යුතු අමාත්‍යාංශයේ නිලධාරීන් ඇප තැබීමට කටයුතු කර නොතිබුණි.